මෙන්න ධර්මප්‍රිය ඩයස් ගේ සොඳුරු කැදැල්ල

වැල්වටාරම අවශ්‍ය නැත.... ඔහු ධර්මප්‍රිය ඩයස්. පළමුවෙන්ම ඔහු මට නෙත ගැටෙන්නේ තුමිඳු දොඩන්තැන්නගේ 'අරුන්දති' නාට්‍යයෙනි. එහි බ්‍රාහ්මණයෙකු ගේ චරිතය නිරූපණය කළ අතර බැමිණිය ලෙසින් හසිනිකා කරල්ලියද්ද, දියණිය ලෙසින් ගයනි ගිසන්තිකා ද සිටියා මතකය.

ඒ අනුව දශකයේ අග භාගයයි. අනතුරුව වේදිකාවේ නිතර ඇසෙන නමක් බවට පත් වූ අතර, සිනමාව, පුංචි තිරයේ රංගනය මෙන්ම හඬ කැවීම ශිල්පියෙකු ලෙසින් ද නිසග ප්‍රතිභාව විකසිත කරන්නට විය. වේදිකාවේ සහ සිනමාවේ සම්මානනීය රංගන ශිල්පියෙක් සහ නාට්‍ය වේදියෙක්වන ධර්මා මේ දිනවල පුංචි තිරයේ ජනප්‍රියම නළුවා ලෙසින් සුවහසක් ප්‍රේක්ෂකයන් ගේ නිරන්තර කතා බහට ලක් වී සිටී.

"... ඊයෙ දෙවැනි ඉනිම බැලුව ද? අවන්තයාට ආනන්ද නියමෙට කියල දුන්නා... පිස්සු හැදෙන ඇක්ටිං...."

මෙය ඇසුණේ සති දෙකකට පමණ ඉහත දී කාර්යාල දුම්රියක දීය. විශේෂත්වය වන්නේ කතා බහට එක්වී සිටියේ මැදිවියේ සිටි කාන්තාවන් තුන් දෙනෙක් වීමයි.

ඔහු සේම කුසලතා පිරි නළුවන් මෙගා - රැල්ලේ හාස්‍ය රංගනයන් හරහා ප්‍රේක්ෂකයාට කිචි කවා ගෙන සිනාසීම සලස්වද්දී, ධර්මප්‍රිය ඩයස් තම නිරායාස රංගනයෙන් ප්‍රේක්ෂකයා තුළ ප්‍රබල හාස්‍යයක් මතු කිරීමට සමත්වෙයි. බොහෝ දෙනා රාත්‍රී නින්දට යන්නේ; 'දෙවැනි ඉනිමේ ආනන්ද' හෙට මොනවා කියාවිද, කරාවිද යන සිතිවිල්ලත් සමඟිනි.

පහතින් දැක්වෙන්නේ ඒ සොඳුරු ආඥාදායකයා සමඟ දියණිය කළ කතාබහකි.

ඉතින් ධර්මා කොහොමද තොරතුරු... මේ දවස්වල ප්‍රේක්ෂක ප්‍රතිචාරවලින් හිඟයක් නැතිව ඇති....?

"අනිවාර්යයෙන්ම, ඒක සොඳුරු වදයක් වුණු අපූරුම අත්දැකීමක්. ඒ වදය මම ආසාවෙන් විඳිනවා. සතුටුයි."

අපි මුල ඉඳලම එමු. කොහෙද ගම්පළාත...?

"ගම කැස්බෑව. අපේ පවුලෙ හත් දෙනයි. තාත්තා, අම්මා, අයියලා තුන් දෙනෙක්, අක්කා සමඟ බාලයා තමයි ධර්මප්‍රිය ඩයස්.

පාසල් ගියේ කොළඹ සර් ජෝන් කොතලාවල විද්‍යාලයට. ඉන් පස්සෙ පිළියන්දල නවෝදය පාසලට.

පවුල තුළ කලාවට නැඹුරුවක් තිබුණා ද?

"නැහැ. නමුත් ගමේ තිබුණු ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් මා තුළ විශාල පෙලඹවීමක් ඇතිකළා. කැස්බෑව වැව මැද්දෙ, කැස්බෑව හන්දියෙ එහෙම නාට්‍ය කළා. එතකොට වයස අවුරුදු හත අටක් ඇති මගෙ හිතේ.

ඉන්පස්සෙ මුතුහර ළමා සමාජයට එකතු වෙලා නාට්‍ය කළා. ඉස්කෝලෙ සමිතියෙ නාට්‍ය කළා. ඒ මොනවා කළත් බලපු හැමෝම මගේ රංගනයන් අගය කළා. ඒක හොඳ උත්තේජනයක් නෙ ඉදිරියට යන්න. උසස් පෙළ කරද්දි මගේ නාට්‍ය ගුරුතුමා හමුවෙනවා. ප්‍රේමකුමාර කරුණාරත්න. එතන ඉඳල තමයි හරි මාවතට වැටෙන්නෙ"

ඉතින් ඊට පස්සෙ...

"ප්‍රවීණ නාට්‍යවේදී බන්දුල විතානගේ හමුවෙනවා. එතුමාගේ 'රෝමය ගිනි ගනී' නාට්‍යයට සම්බන්ධ වීමට අවස්ථාව උදාවුණා. නලීන් මාපිටිය කියන මිත්‍රයා තමයි එයට අවස්ථාව ලබා දුන්නෙ.. ඉන්පස්සෙ කේ. බී. හේරත් ගෙ දෙවෙනි මහින්ද... වාසුදේව වගේ නාට්‍යවල රඟපාන්න ඉඩ ලැබෙනවා. මේ අනූව දශකයේ මැද භාගයේ ආරම්භය...

ජයලත් මනෝරත්න ගේ කණේරු මල, තුමිඳුගෙ අරුන්දති, චාමික හත්ලාවත්ත ගේ හයිනා, හරි අපූරු දවසක් වගේ නාට්‍යවල රඟපෑවා. ඉන් පස්සෙ රාජිත දිසානායකගේ නාට්‍ය කණ්ඩායමට බැඳිල අවුරුදු දහතරක් වගේ කාලයක් වැඩ කළා.

වීරයා මැරිලා, සිහින හොරු අරන්, බකමූණා විදි බසී, ආපහු හැරෙන්ඩ බෑ, නැතුව බැරි මිනිහෙක් වගේ නාට්‍ය"

ඔය අතරේ විශාල වශයෙන් ඔබ සම්මානයට පාත්‍ර වෙනවා නිරන්තරයෙන්ම.

"ඔව්, මට මතක හැටියට කියන්නම්, හොඳම නළුවා වුණා හයිනා නාට්‍යයේ. 97 යෞවන සම්මාන හොඳම සහාය නළුවා වුණා සඳ සෙවණැල්ල නාට්‍යයේ. 2004දි හොඳම රංග භූමි අලංකරණය, දාස මල්ලිගෙ බංගලාව නාට්‍යයට, 2006දි හොඳම රංග විනයාසය - ගැහැනු වැඩ අරඹති නාට්‍යයට... තව සෑහෙන්න තියෙනවා නිර්දේශවීම් එහෙම. මේ ඉතාම මෑතකදි 2017 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා වුණා. නැතුව බැරි මිනිහෙක් නාට්‍යය වෙනුවෙන්

සිනමාව පැත්තෙන් බොහෝ නළුවන්ට වඩා ඔබ වාසනාවන්තයි නේද?

"ඇත්තෙන්ම සිනමාවේ කෙටි ගමනක් තුළ 2008 අවුරුද්දෙදි සරසවිය සම්මාන උළෙලේ වගේම සිග්නිස් සිනමා උළෙලේ දී 'මචං' චිත්‍රපටිය වෙනුවෙන් හොඳම නළුවාට හිමි සම්මානය ලැබුණා. ඒකත් මගේ ජීවිතයේ සදානුස්මරණීය අවස්ථාවක්. ඒක තමයි මෙන් රෝල් එකක් කරපු පළමුවැනි ෆිල්ම් එක.

ටෙලි ෆීල්ඩ් එකට එන්නෙ ජාතික රූපවාහිනියෙම නිර්මාණයක් වුණු 'ඉංගම්මාරුව' සීරිස් එකෙන්. ඒක තමයි පළමු අත්දැකීම. අවුරුදු දෙකක් බැහැගෙන වැඩ කළා. හොඳම අත්දැකීමක් ලැබුණා ටෙලි නිර්මාණ ගැන"

එතකොට ඔබේ වේදිකා නිර්මාණ....

"පළමු නාට්‍යය 'ගැහැනු වැඩ අරඹති' ඒක අනුවර්තනයක්. හොඳම රංග විනයාසය, හොඳම රංගන වස්ත්‍රාභරණ, ජූරියේ විශේෂ සම්මානයක් ලැබුණා. ඊළඟ නාට්‍යය තමයි සාදය මාරයි - සල්ලි හමාරයි. එය ඉතාම ආකර්ෂණීය, සම්මාන දිනූ නාට්‍යයක් වුණා. රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා, හොඳම නිළිය, හොඳම වේදිකා පරිපාලනයට සම්මාන ලැබුණා. ඒ වගේම හොඳම නාට්‍යයටයි, අධ්‍යක්ෂණයටයි නිර්දේශ වුණා.

මේ නාට්‍යය තමයි ඉතාම වේගයෙන් දර්ශන වාර සීය පසු කරපු, දර්ශන තුන හතර බලපු ප්‍රේක්ෂකයො ඉන්නවා. මේක සරල ප්‍රහසනයක් වාගෙ පෙනුනට ප්‍රබල යටිපෙළ අරුතක් තියෙනවා. මේ වෙද්දි දර්ශන වාර දෙසීයට ආසන්නයේ ඉන්නෙ"

දෙවැනි ඉනිම ටෙලිය ඔබ පිළිබඳ මහා කතිකාවතක් නිර්මාණය කළා නේද?

"අනිවාර්යයෙන්ම. අතිවිශාල ප්‍රේක්ෂක පිරිසක් මහා ප්‍රසාදයකින් ඒ ගැන කතා කරනවා. ඒක හරිම ආශ්වාදනීයයි. ඔහොම තමයි ඉතින්"

ඔබේ කැදැල්ල ගැනත් කතා කරමු ධර්මා....

"බිරිඳ අනෝජා මිලන්ති. පුතාලා දෙන්නයි. ලොකු පුතා ස්වර්ණ රාවණ ඩයස්. එයාට වයස අවුරුදු නමයයි. දෙවැනියා පවර භාෂණ ඩයස්. එයාට වයස හතයි"

බිරිඳ රැකියාවක් කරනවාද?

"නැහැ... එයා නිවෙසේ සහ දරුවන්ගේ කුදුමහත් කටයුතු කරමින් මට නිදහස දීලා තියෙනවා. ඇය තමයි මගේ ශක්තිය"

සාර්ථක මිනිහෙක් පිටුපස යහපත් දිරිය ගැහැනියක්...

"ඒක තමයි නියමම කතාව. ඒ ප්‍රකට කියමනට අනෝජා හොඳම උදාහරණයක්"

අජන්ත ජයසේකර
ඡායාරූප - චන්ද බන්දුල

Scan with EasyScan